**<u>ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් (2020-2022)ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම - පාසල් වෙත ස්ථාන ගත කිරීම සඳහා අයදුම්පත්‍රය</u>**

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල 2020/2022 වර්ෂවල පාඨමාලා හදාරන ලද ශික්ෂණලාභීන්ට පත්වීම් ලබාදීම සඳහා වන තොරතුරු රැස්කිරීම මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කිරීමට නියමිතය.

ඒ අනුව ***teacher.moe.gov.lk*** ඔස්සේ එහි ඇති උපදෙස් පරිදි **2025.03.20** දින සිට **2025.03.28** දින දක්වා එම ශික්ෂණලාභීන්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

## සැලකිය යුතුයි.

- එක් අයදුම්කරුවෙකුට මාර්ගගත ක්‍රමය ඔස්සේ දත්ත පද්ධතියට පිවිසීමට අවස්ථාව හිමිවන්නේ එක් වරක් පමණි. එබැවින් දත්ත පද්ධතියට පිවිසීමට ප්‍රථම උපදෙස් මාළාව හොඳින් කියවා දත්ත අතුළත් කිරීම සිදු කළ යුතුය.

- ස්ථානගත කිරීම සම්බන්ධව තොරතුරු ලබා දෙන තෙක් දත්ත පද්ධතියට පිවිසීම සඳහා භාවිතා කරන **USER NAME** සහ **PASSWORD** ඔබ සතුව පැවතීම අත්‍යාවශ්‍ය වේ.

- ස්ථානගත කිරීමේදී ඔබ බඳවා ගනු ලැබූ පළාතට ප්‍රමුඛතාව ලබාදෙමින් <u>ජාතික අධ්‍යාපන ආයතනයේ</u> ප්‍රතිඵල ලේඛනයේ සඳහන් ඔබගේ විෂයයට අදාළ <u>කුසලතා අනුපිළිවෙල</u> සැලකිල්ලට ගනිමින් පමණක් ස්ථානගත කිරීම් සිදු කරනු ලැබේ.

- අත්‍යාවශ්‍ය පුරප්පාඩු සඳහා ඔබ විසින් මනාපය පළ කර නොතිබුණද, කුසලතා ලේඛණයේ පහළම කුසලතාවයක් ලබා ඇති අයදුම්කරුවන්ගෙන් සේවා අවශ්‍යතාවය සලකා එම අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලබන අතරම, ඔබ අයත් පළාත තුළ පවතින පුරප්පාඩු ප්‍රමාණවත් නොවන්නේ නම්, පුරප්පාඩු පවතින වෙනත් පළාතක් වෙත ඔබව යොමු කිරීමට ද සිදුවේ.

- තවද අප විසින් තහවුරු කර ගත් පුරප්පාඩු සඳහා පමණක් ස්ථානගත කිරීම් සිදු කරනු ලබන අතර, විදුහල්පතිවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන පුරප්පාඩු ලිපි කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

- **විශේෂයෙන් ඔබ බඳවා ගනු ලැබූ පළාතට ප්‍රමුඛතාව ලබාදෙමින් <u>ජාතික අධ්‍යාපන ආයතනයේ</u> ප්‍රතිඵල ලේඛනයේ සඳහන් ඔබගේ විෂයයට අදාළ <u>කුසලතා අනුපිළිවෙල</u> ඔස්සේ පමණක් ස්ථානගත කිරීම් සිදු කරන බැවින්, ඔබ අපේක්ෂා කරන සේවා ස්ථානයටම පත්වීම් ලබා දෙන බවට පොරොන්දු ලබා දෙමින්, මුදල් ලබා ගැනීම සඳහා උත්සාහ කරන වංචනික පුද්ගලයන්ට හසුවීමෙන් වලකින ලෙස දැනුම් දෙමු.**